# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
## பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்
## CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE


| | | | |
|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My Ref. | CSS/03/06/03/04/2022(35) | ඔබේ අංකය / உமது இல. / Your Ref. | |
| දිනය / திகதி / Date | 2022.04.30 | | |

ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය,
ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සියලුම අමාත්‍යාංශ ලේකම්වරු / සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් / ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්,
දකුණු පළාත.

**<u>දකුණු පළාත් රාජ්‍ය සේවයේ වාර්ෂික ස්ථාන මාරු මණ්ඩල තීරණ - 2022 ක්‍රියාත්මක කිරීම</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් මා අමතන ලද දකුණු පළාත් ආණ්ඩුකාර ලේකම්ගේ අංක G/SP/3/3/TR/7 හා 2022.04.20 දිනැති ලිපිය හා දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ අංක SP/PSC/07/02/04(79) හා 2022.04.25 දිනැති ලිපිය හා බැඳේ.

02. එමගින්, දකුණු පළාත් සභාවේ සේවයේ නියුතු සියලුම නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු 2022.06.01 දින සිට ක්‍රියාත්මක කිරීමට නියමිත ව තිබුණත්, රට තුළ පවතින වත්මන් තත්ත්වය හමුවේ එකී ස්ථාන මාරුවීම් 2023.01.01 දින සිට ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලෙසට දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමන්ගේ උපදෙස් පරිදි දැනුම් දී ඇත.

03. ඒ අනුව, **දකුණු පළාත් සභාවේ සේවයේ නියුතු සියලුම නිලධාරීන්ගේ 2022 වාර්ෂික ස්ථාන මාරු <u>2023.01.01 දින සිට</u> ක්‍රියාත්මක කරන ලෙස** මින් නියෝග කරමි.

04. තව ද, එකී සියලුම සේවාවන්ට අදාළ ව වාර්ෂික ස්ථාන මාරු සමාලෝචන මණ්ඩල නියමිත කාලවකවානුව තුළ පවත්වා අදාල තීරණ දැනුම් දීමට කටයුතු කරන ලෙස කාරුණික ව දන්වා සිටිමි.

05. **එසේම, ඉහත පරිදි 2022 වාර්ෂික ස්ථාන මාරුවීම් කල්දැමීම නිසා ඇතිවන ප්‍රායෝගික ගැටළු ඇත්නම් ඒවා අධ්‍යයනය කර නිරීක්ෂණ හා නිර්දේශ ඇතුළත් වාර්තාවක්, අදාල බලධාරීන් වෙත යොමු කිරීම සඳහා 2022.07.31 දිනට පෙර මා වෙත යොමු කරන ලෙස** ද වැඩිදුරටත් දන්වමි.

ආර්. සී. ද සොයිසා
ප්‍රධාන ලේකම්
දකුණු පළාත

ආර්. සී. ද සොයිසා
ප්‍රධාන ලේකම්
දකුණු පළාත


| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary | 091 4944002 | කාර්යාලය / காரியாலயம் / Office | 091 4119011 / 091 2226118 | ෆැක්ස් / பெக்ஸ் / Fax | 091 2246299 | විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail | chiefsec1@sltnet.lk | වෙබ් අඩවිය / இ தளம் / Web site | www.cs.sp.gov.lk |

ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretariat, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.
"සෞභාග්‍යමත් දකුණු පළාතක්"